# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2179/40 - 2020 ජුනි මස 12 වැනි සිකුරාදා - 2020.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/04/2017/209

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.04.09 දිනැති හා අංක 2066/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.11.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 10, ආනන්ද රාජකරුණා මාවත, අංක 141 හි පිහිටි නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය (සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන්) සහ කටුනායක, ආයෝජන ප්‍රවර්ධන කලාපය හි පිහිටි ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.12.31 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු
සේවා සේවක සංගමය,
අංක 141, ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

*පළමුවන පාර්ශවය*

නඩු අංකය : A /28/2018
IR/COM/04/2017/209

සහ

ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයෝජන ප්‍රවර්ධන කලාපය,
කටුනායක.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලා තන්තිරිගේ දොන් ජෝන් සෙනවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියැවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත

මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර ඇත.

එකී ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

"ඒ. ටී. ජී. සිලෝන් (ප්‍රයිවට්) ලිමටඩ් සමාගමට වසර 25ක් පිරීම නිමිත්තෙන් ලබා දුන් තිළිණයන්, එය ලබා ගැනීමට සුදුසුකම් සපුරා තිබියදීත් පහත සඳහන් සේවකයන්ට ලබා නොදීම යුක්ති සහගත ද යන්න හා එසේ යුක්ති සහගත නොවේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන මොනවා ද යන්න පිළිබඳව වේ".

1. ඩබ්. කැලුම් ප්‍රේමතුංග
2. බී. කේ. ජයනාත් පෙරේරා
3. සී. ඩබ්. ආර්. ඉන්දික වඩුගේ
4. එච්. ආර්. කේ. ගුණරත්න
5. ඩබ්. ඩී. ආර්. ශ්‍රීමාල්
6. එල්. පී. සුසන්ත

**බේරුම්කරණ ප්‍රදානය**

2018.04.04 වැනි දින මෙම ආරාවුල බේරුම්කරණය මගින් විසඳා ප්‍රදානයක් ලබාදීම සඳහා මා වෙත ඇමතිතුමා විසින් යොමු කර ඇත.

ඒ අනුව 2018.05.17 වැනි දින පළමු වන පාර්ශවය තම පළමු වන ප්‍රකාශය පැ. - 1 සිට පැ. - 27 දක්වා වූ ඇමුණුම් සහිතව ඉදිරිපත් කර ඇති අතර සිය දෙවන ප්‍රකාශය ද ගොනු කර ඇත. දෙවන පාර්ශවය විසින් ද සිය පළමු වන හා දෙවැනි ප්‍රකාශ ගොනු කර ඇත.

මෙම ආරාවුල සම්බන්ධයෙන් මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් මෙම ආරාවුල සමථ කිරීමේ දී 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 12 (1) වගන්තිය යටතේ කාර්මික ආරාවුල සාමදාන කිරීමෙන් නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයේ දෙපාර්ශවය අතර පවත්නා ආරාවුල ලෙසට සඳහන් කර ඇත්තේ,

01. 2019.01.11 දිනැති ලිපිය අනුව සේවය අවසන් කිරීම.

02. ඒ/28/2018 දිනැති බේරුම්කරණ කාලයට අදළ රන් තිළිණ ලබා නොදීම.

යන කරුණු වන අතර ඒ සම්බන්ධයෙන් එකඟ වී ඇති සමථය වන්නේ සමථයට පත් කර ඇති ඇමුණුමේ සඳහන් කොන්දේසිවලට යටත්ව පිළිවෙලින්,

01. ඩබ්. ඩී. ආර්. ශ්‍රීමාල් - රු. 2,500,000.00
02. ලියනපතිරණගේ සුසන්ත - රු. 2,500,000.00
03. රවීන්ද්‍ර කුමාර ගුණරත්න - රු. 2,500,000.00
04. රොෂාන් ඉන්දික වඩුගේ - රු. 2,305,235.00
05. කසුන් ජයනාථ පෙරේරා - රු. 1,738,300.00
06. කැළුම් ප්‍රේමකුමාර - රු. 56,493.75ක් ද ලබාගෙන බේරුම්කරණ යොමුව වන ඒ/28/2018 නඩුවට අදළ සියලු කරුණු සම්බන්ධයෙන් සමථය ක්‍රියාත්මක වන බවයි.

මෙහි දී දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කොමසාරිස්වරයා කාර්මික අධිකරණයේ පවතින බේරුම්කරණයේ නඩුවක් සම්බන්ධයෙන් 12 (1) කොන්දේසි පත්‍රයක් අත්සන් කිරීමේ බලයක් නොතිබුණා වුව ද, මේ වන විටත් එම සමථයට දෙපාර්ශවය ඇතුළත් වී (එක් එක් පැමිණිලිකරු වෙන වෙනම) ආරාවුල නිරවුල් කර ගෙන ඇති බැවින් එකම කරුණක් සම්බන්ධයෙන් දෙවරක් සහන ලබාදීම පවත්නා නීතිය අභිබවා යන්නක් වන බැවින් මෙම බේරුම්කරණ නඩුව පවරා ඇති වෘත්තීය සමිතියේ ඉල්ලීම පිළිගෙන ඔවුන්ට පක්ෂව ප්‍රදානයක් ලබාදුන හොත් එය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් නොවනු ඇත.

කරුණු එසේ හෙයින් දැනටමත් මෙම පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් සියලු දෙනාම මේ සම්බන්ධයෙන් යොමු කර ඇති මූලික සහන ලබා ගෙන ඇති බැවින් ප්‍රදානයන් ලබාදීම මගින් දෙවන පාර්ශවයට අගතියක් සිදුවනු ඇත.

එබැවින් මෙම බේරුම්කරණ නඩුව සම්බන්ධයෙන් ප්‍රදානයක් නොකරමි.

මෙය යුක්ති සහගත හා සාධාරණ තීරණයක් බව මාගේ හැඟීමයි.

ටී. පියසෝම,
බේරුම්කරු.

2019 දෙසැම්බර් මස 31 වැනි දින.

06 - 261

---

*මගේ අංකය* : IR/12/02/2005 (SUB)

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 1876/35 දරන හා 2014.08.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් පන්නිපිටිය, රුක්මලේ, මාලිකා නිවාස පාර, අංක 213/39 හි පදිංචි ජී. එච්. උදය සමන් මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 08, ඇල්විටිගල මාවත, වික්ටෝරියා පෙදෙස, අංක 17හි පිහිටි ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3576 දරන හා 2019.12.12 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ජී. එච්. උදය සමන් මයා වෙතින්

කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3576 දරන බේරුම්කාර ප්‍රදනය ක්‍රියාත්මක වීම 2021.01.29 වැනි දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 13 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**පළමුවන උපලේඛනය**

*"අ" ආකෘති පත්‍රය*

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

***බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම***

ලිපිනය : 213/39, බාලිකා නිවාස පාර
රුක්මලේ, පන්නිපිටිය.
2020.02.27

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2020.01.30 දිනැති අංක 2160/37 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ද ජී. එච්. උදය සමන් සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය බැඳී සිටින්නාවූ ද 2020.12.12 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන :

පිටපත : (අනෙක් පාර්ශවය)

(1) ප්‍රතික්ෂේප කරන පර්ශවය, වෘත්තිය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට, සේවා යෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9 (1), 15 (1) හා 20 (1) වන වගන්තිය බලන්න).

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක්, සේවා යෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තිය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තිය සමිතියේ දරණ තනතුරද නිශ්චිතව සඳහන් කළ යුතුය.

06 - 262

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.